# දකුණු පළාතට අයත් විහාර බිතු සිතුවම් ආශ්‍රිත බලි චිත්‍ර කලාව පිළිබඳ අධ්‍යයනයක්

එම්.ජී.එච් මදුසිකා

පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
harshanimadusika9@gmail.com

**මුඛ්‍ය පද**- බලි, විහාර, සිතුවම්, පහතරට සම්ප්‍රදාය, දකුණු පළාත

## හැඳින්වීම

මෙරට තුල බලි යාගයන් හා බැඳුණු බලි කලාව කොපමණ නම් කාලයක සිට පැවත එන්නේ දැයි නිශ්චිතව ම සඳහන් කළ නොහැකි ය. බලි යන්නෙහි මූලික අරුත වන්නේ "ප්‍රජාව" යි. එහෙත් අද එම වචනය මැටියෙන් අඹන ලද රූප හැඳින්වීම සඳහා ද යොදනු ලැබේ (ගුණසිංහ 2014:26). ඇතැම් අර්ධ වනචාරී ගෝත්‍ර ලෙස ජීවත් වූ මිනිසුන් තම එක් එක් ගෝත්‍රය වෙන්කොට හඳුනා ගැනීම සඳහා යොදාගනු ලැබූ ලාංජන වලට බලි යන නාමය යොදාගෙන ඇත (පීරිස් 2000: 65-66). බුද්ධ දේශනා අතර එන අංගුත්තර නිකායේ පත්තකම්ම වග්ගයේ පංච බලි සංකල්පයක් අනුදැන වදාරා තිබේ (බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා 1962:128). එසේම මෙරට මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදාය ආරම්භ වන අවධියේ එය ග්‍රාමීය ජනයා තුළ බලි කලාව ජනප්‍රියව පැවති බව පහතරට විහාර සිතුවම් ආශ්‍රිතව පෙනේ. ගාල්ල, දොඩන්දුව ශෛල බිම්බාරාමය, පරගොඩ රජමහා විහාරය, කරගම්පිටිය සුබෝධාරාමය, දෙනිපිටියේ වැලිහිඳ සුදර්ශනාරාමය, මාතර කොටිකාගොඩ පුරාණ විහාරය, අහංගම එළුකැටියේ විහාරය, කතළුව පූර්වාරාමය යන විහාරස්ථාන මෙම බලි සිතුවම් කලාව පිළිබඳව අධ්‍යයනය කරන ස්ථාන අතරින් කිහිපයකි. ඒ ඔස්සේ බලි සිතුවම් කලාවේ නිර්මාණිත පසුබිමත් එහි ස්වභාවයත් පිළිබඳව මෙහිදී අවධානය යොමු කෙරේ.

## ක්‍රමවේදය

උක්ත පර්යේෂණය සඳහා අදාළ දත්ත රැස්කර ගැනීමේ දී ක්ෂේත්‍ර ගවේෂණය හා ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රම භාවිතා කරන අතර, ක්ෂේත්‍ර ගවේෂණයේ දී තෝරා ගන්නා ලද ඇතැම් ස්ථාන වෙත ගොස් අධ්‍යයනය කිරීමත්, ක්ෂේත්‍ර නොවන ගවේෂණය මගින් අදාල පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය පුස්තකාල පරිශීලනය ඔස්සේ ඊට අදාලව සාහිත්‍යමය මූලාශ්‍රය අධ්‍යයනය සිදුකරන ලදි. එසේම මා හට අවශ්‍ය ඡායාරූප සහ අතිරේක තොරතුරු ලබාගැනීම සඳහා අන්තර්ජාලය භාවිතය ද සිදුකරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

බලි ශාන්තිකර්මයක් ලෙස ක්‍රි.ව. 1457 දී ලංකාවට පැමිණි බමුණන් දහනව දෙනෙකුගෙන් පැවත එන බව බොහෝ දෙනාගේ විශ්වාසය යි. ඒ අතර බලි තොවිල් ඇඳුරු පරපුරක් එමගින් නිර්මාණය විය. ඉතිහාසගත තොරතුරු අනුව ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසින් කරවන ලද විහාරයක් කුණ්ඩසාලය ප්‍රදේශයේ පිහිටා ඇති අතර රජු සිය මාලිගය කරවීමට පැමිණි පිරිස අතර බලි ඇඳුරන් පිරිසක් ද සිට ඇත. පහතරට ප්‍රදේශවල මෙම බලි ඇඳුරන් විහාර චිත්‍රකරණය තුළින් සිය හැකියාවන් පෝෂණය වී තිබෙන බව ඔවුන්ගේ බලි ඇඹීම් සහ වර්ණ ගැන්වීම්, පසුබිම් වර්ණ හා ග්‍රහ රූප සිතුවම්කරණයෙහි පවතින නිමාව දෙස බැලීමේ දී තහවුරු වේ. පහතරට ප්‍රදේශ ආශ්‍රිත විහාරයන්හි මෙම බලි ඇඳුරු පරම්පරාවන් කිහිපයක් සිට ඇති අතර ඔවුන් නමින් වැලිතර සිත්තර පරම්පරාවට අයත් හීමප්පු ගුරුන්නාන්සේ, කඩොල්ගල්ලේ ගණිතයා ආදී ප්‍රසිද්ධියට පත් අයද, ප්‍රාදේශීය වශයෙන් ගෝනන්නේවිල ටීමන් ගුරුන්නාන්සේ ද බලි චිත්‍ර ඇඳීමෙහි යෙදී ඇති බව අධ්‍යයනයට බඳුන් කරනු ලැබූ පරගොඩ රජමහා විහාරයේ සිවිලිම් සිතුවම් මගින් පැහැදිලි වේ. මෙහිදී

දකුණු පළාතේ සිතුවම් වල සුවිශේෂී ලක්ෂණ පෙන්නුම් කිරීම සඳහා බලි තොවිල් කලාවේ බලපෑම ද හේතු වන්නට ඇත.

දකුණේ සිත්තරුන් විහාර චිත්‍ර වලදී ත්‍රිමාණාකාරව රූපයෙදීමේ දී අග පසග පෙන්වීමට බලි ඇඹුම් කලාවේ ද ආභාසය ලබන්න ඇති බව එම සිතුවම් අධ්‍යයනයෙන් පැහැදිලි වේ. එසේම මහනුවර සිතුවම් සම්ප්‍රධායටම අයත් වුවත් දකුණේ බෞද්ධ විහාරයන්හී දක්නට ලැබෙන සිතුවම් ඊට ම ආවේණික වූ සමාජ පසුබිමක් පදනම් කරගෙන ගොඩනැඟී ඇත. ඒ සඳහා විදේශීය ආධිපත්‍යයේ බලපෑම් ආදී කරනකොට ගෙන බෞද්ධ ආගම හා එම සංස්කෘතිය ඉක්මවා ගිය යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම් සම්ප්‍රදායක් වෙත ගැමියා නැඹුරු විය.

මෙහි දී බලි නිර්මාණ සඳහා වෙනම ශිල්පී පරපුරක් වූ බව ද ඇතැම් විට විහාරස්ථාන වල චිත්‍ර අඳින සිත්තරුන් ද මීට එකතු වූ බව පෙනේ. මෙම බලි නිර්මාණ ශිල්පීන් පළඳින වෙස්මුහුණු සැකසීමට ද රාක්ෂ, ග්‍රහ සහ දේවතා රූ ඇතුළත් බලි රූ ඇඳීමට හෝ ඇඹීමට චිත්‍ර ශිල්පීන්ගේ සහයෝගය අවශ්‍ය වේ. මේ නිසා විහාර චිත්‍රකරණයෙහි නිරත වී සිටි ශිල්පියෙකුට තවත් තැනක දී බලි රූප අඳින හා අඹන ශිල්පියෙකු ද වේ (සෝමතිලකඃ 2002-447). එස්.පී. චාල්ස් පෙන්වාදෙන පරිදී අතීතයේ දී තොවිලයට බලිය අඹන ලද්දේත් සිත්තරුන් වන බවයි. නමුත් විහාර සිත්තරුන් බලි තොවිල් නිර්මාණය කළේ ද, බලි තොවිල් ඇඳුරන්ගේ සහාය විහාර සිත්තරුන් ලබාගත්තේ ද යන්න පැහැදිලිව හඳුනාගැනීමට නොහැකි වන්නේ බලි තොවිල් ඇඳුරු පරපුරක් වෙනම ම පැවතීම නිසා ය. ඒ බව ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසින් සිය මාලිගය ඉදිකිරීමට කැඳවූ ශිල්පීන් අතර බලි ඇඳුරන් පිරිසක් ද වූ බව ඉතිහාසයේ සඳහන් වේ.

විශේෂයෙන් පහතරට සිතුවම් අධ්‍යයනයේ දී බලි ඇදුරන්ගේ නිර්මාණාත්මක සහය ද ලැබී ඇති බව පැහැදිලි ය. ගාල්ල, පරගොඩ රජමහා විහාරය අනුරාධපුර යුගයට අයත් පහත රට සම්ප්‍රදායේ සිතුවම් ඇති ස්ථානයකි. එහි හමුවන වියන්තල සිතුවම් අතර බලි සිතුවම් කලාවක ලක්ෂණ පිළිඹිබු කරයි.  එම සිතුවම් සඳහා වස්තුවිෂය ලෙස ජ්‍යෝතිෂ්‍යයේ එන නවග්‍රහ මණ්ඩලය හා ග්‍රහයින්ගේ රථ ද ඇඳ ඇත. දොඩන්දූවේ ශෛල බිම්බාරාමය, සපුගස්කන්ද විහාරයෙහි, මිරිස්ස සමුද්‍රගිරි විහාරයේ ද රාශි දොළහ ද නැකැත් විසිහත ආදී විෂයන් විහාර සිතුවම්හි බලි කලාවේ බලපෑම ඉතා හොඳින් පෙන්වයි. එසේම වැලිහිඳ සුදර්ශනාරාමයේ "සිව් වටුක රූපය" හා "අසෝර රූපය" ඇඳ ඇත්තේ ද බලි ඇඹුම් කව්වල ලක්ෂණ උපයෝගී කොටගෙන ය.

පහතරට මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රිතව බිහි වී වර්ධනය වූ වෙස් මුහුණු කලාවේ කේන්ද්‍රස්ථානය වූ අම්බලන්ගොඩ තෙල්වත්ත ප්‍රදේශ අතර මේවා නිපද වූ කලාකරුවන් විහාරස්ථාන සමඟ තිබූ සමීප සම්බන්ධතාව හේතුකොට ගනිමින් ඔවුන්ගේ සමකාලීන වෙස් මුහුණු කර්මාන්තයට ද එම විහාර සිතුවම්හි බලපෑමක් තිබෙන්නට ඇති බව යොදා ගෙන ඇති මෝස්තර හා නිරූපණ ශෛලීන්ගෙන් පෙනේ. තෙල්වත්ත විහාරයේ වියන් චිත්‍ර අතර තිබෙන පංචනාරී සටය පසුකලෙක කෝලම් වෙස් මුහුණුවලද යොදා ගැනීම මඟින් විහාර සිත්තම් කලාවට සීමා නොවූ බලි කලා සම්ප්‍රදායක් දැකගත හැකි ය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

අරුණසිරි, කේ. යූ., ***පුරාණ ලක්දිව බලි නිර්මාණ තාක්ෂණය,*** (2015 මැයි 20) (දිවයින) බදාදා අතිරේකය.

විතානගේ, පී., (2005)***. චිත්‍ර කලාව ඇගැයීම***, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.